සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පළමු වාර පරීක්ෂණය - 2020

10 - ශ්‍රේණිය

බුද්ධ ධර්මය - I

කාලය: පැය 03යි.

නම/විභාග අංකය :- ....

අමතර කියවීම් කාලය විනාඩි 10යි.

සැලකිය යුතුයි.

- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට (1) , (2) , (3) , (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුළ(×) ලකුණ යොදන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද පරිස්සමෙන් කියවන්න.

(01) බෝසතාණන් වහන්සේ සිය අරමුණු ඉටු කර ගත හැකි සාර්ථක ජීවිතයක් සඳහා පදනම සකස් කර ගත යුතු ආකාරය පිළිබඳ නුවණින් විමසා බැලුහ. ඒ බව ප්‍රකට වන්නේ ,

(1) දුෂ්කර ක්‍රියා කිරීමෙනි. (2) පංච මහා විලෝකන තුළිනි.
(3) සිංහ නාද පැවැත්වීමෙනි. (4) ඥාතීන් ඉදිරියේ ශිල්ප දැක්වීමෙනි.

(02) වෙනත් කිසිදු උපතක දක්නට නොලැබුන ආශ්චර්යමත් සිදුවීම් කිහිපයක් බෝසත් උපත සිදුවීමත් සමග සිදු විය. ඊට අයත් නොවන්නේ,

(1) සත් පියුම් පිපීම (2) පළමු උදාන වාක්‍ය කීම
(3) සිංහ නාද පැවැත්වීම (4) උපත සිදුවූ විගස පියවර තැබීම

(03) කුසල් සිතිවිලි වර්ධනය කර ගැනීම සඳහා අප පුරුදු පුහුණු කළ යුත්තේ,

(1) සිල් රැකීම ය (2) වත් පිළිවෙත්හි යෙදීමය
(3) දන්දීමය (4) භාවනාවේ යෙදීමය

(04) යසෝදරා හෙවත් භද්දකච්චායනා දේවියගේ පියා වන්නේ,

(1) අංජන රජතුමා (2) මිගාර සිටුතුමා (3) සුප්‍රබුද්ධ රජතුමා (4) ධනංජය සිටුතුමා

(05) රහසත් පව් නොකොට .... යන කවිය ඇතුළත් කෘතිය වන්නේ.

(1) මුණිගුණාලංකාරය යි (2) බුදුගුණ අලංකාරයයි
(3) බුත්සරණ යි (4) පූජාවලියයි

(06) ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ .... යන ගාථාවේ සඳහන් ධර්ම රත්නයේ ගුණ ප්‍රමාණය,

(1) නවයකි (2) හයකි (3) තුනකි (4) විසි හතරකි

(07) ආර්ය සත්‍යය අවබෝධ කරගෙන සම්පූර්ණයෙන්ම දුකින් එතෙර වීමේ මං පෙතක් විවර වන්නේ,

(1) පන්සිල් රැකීමෙනි (2) දස කුසලයේ යෙදීමෙනි
(3) දහම් ඇසීමෙනි (4) තෙරුවන් සරණ යෑමෙනි

(08) බුදු දහමේ පංච නීවරණ උපමා මගින් දක්වා ඇත. එහිදී බොර ජලයට උපමා කර ඇත්තේ,

(1) විචිකිච්ඡාවයි (2) ව්‍යාපාදයයි (3) ථීන මිද්ධයයි (4) උද්ධච්ච කුක්කුච්ඡයයි

(09) සීලයෙන් යුතුව සමාධි භාවනාව සඳහා යොමුවීමේදී පුද්ගලයකු තුළ තිබිය යුතු ගුණාංග වන්නේ,

(1) සති සම්පජඤ්ඤ, සන්තුට්ඨිතාව, සුභරතාව

(2) ඉන්ද්‍රිය සංවරය, සන්තුට්ඨිතාව, සුභරතාව

(3) සති සම්පජඤ්ඤ, සන්තුස්සකෝ, සුභරතාව

(4) ඉන්ද්‍රිය සංවරය, සති සම්පජඤ්ඤ, සන්තුට්ඨිතාව

(10) සමථ භාවනාව වඩන පුද්ගලයකු ආචාර්යවරයකු වෙත ගොස් උපදෙස් ලබාගෙන තමාගේ චරිතයට අනුව කර්මස්ථානයක් තෝරා ගත යුතුය. එහිදී තෝරා ගත හැකි අරමුණු හෙවත් කර්මස්ථාන ගණන වන්නේ,

(1) තිහකි (2) හතළිහකි (3) විසිහතරකි (4) පහකි

(11) සියලු කෙලෙස් මුළුමනින්ම නැති කොට ලබන නොබිඳෙන චිත්ත පාරිශුද්ධිය තුළින්ම ඇති තතු ඇති සැටියෙන් දැකීම හැඳින්වෙන්නේ,

(1) ප්‍රඥාව නමිනි (2) සමථය නමිනි (3) විරාගී බව නමිනි (4) බුද්ධිය නමිනි

(12) පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනු,

(1) සතර කර්ම ක්ලේශ වේ (2) සතර ඍද්ධිපාද වේ

(3) සතර අගති වේ (4) සතර මහා භූත වේ

(13) බුදු දහමේ පංචස්කන්ධය ලෙස දැක්වෙන්නේ,

(1) ඇස, කන, නාසය, දිව, ශරීරය (2) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ

(3) රූප, වේදනා, සඤ්ඤා, සංස්කාර, විඤ්ඤාණ (4) රූප, වේදනා, තණ්හා, උපාදාන, කාය

(14) ''ගෞතමයන් වහන්ස ඇතුළත අවුල් ය. පිටත ද අවුල්ය. සත්ව ප්‍රජාව අවුලෙන් වෙළී සිටියි. කවරෙක් මේ අවුල් නිරවුල් කරන්නේද? යනුවෙන් බුදු රජාණන් වහන්සේගෙන් විමසා සිටියේ,

(1) ද්‍රෝණ බමුණා (2) උපක ආජීවකයා

(3) එක්තරා දෙවියෙක් (4) එක්තරා පරිබ්‍රාජකයෙක්

(15) කුසල කර්ම අකුසල කර්මාදී වශයෙන් හැඳින්වෙන දිගු කලක් නැවත කිරීමෙන් ප්‍රබලත්වයට පත් වන චේතනාව පෙරටු කොට ගත් ක්‍රියා හඳුන්වන්නේ,

(1) සඤ්ඤා ස්කන්ධය නමිනි (2) සංඛාර ස්කන්ධය නමිනි

(3) විඤ්ඤාණ ස්කන්ධය නමිනි (4) රූපස්කන්ධය නමිනි

(16) අනිත්‍ය වූ ස්කන්ධාදී ධර්ම අනිත්‍ය යැයි ද, දුක සහිත වූ එම ධර්ම දුක් සහිත යැයි ද අනාත්ම වූ ධර්ම අනාත්ම යයි ද අසුභ වූ එම ධර්ම අසුභ යැයි ද ඇත්ත ඇති සැටියෙන් දැන දැක ගත හැක්කේ,

(1) සිල්වත් වීමෙනි (2) විපස්සනාවෙනි

(3) ධර්ම ශ්‍රවණයෙනි (4) වීර්යයෙනි

(17) ''ඔබට විෂය කරුණු ඉගෙනීමේ දී පොත්පත් මෙන්ම ගුරුවරු ද නොමැති වුවද ස්වෝත්සාහයෙන් ඉගෙන දියුණු සලසා ගත යුතුය ''යි පන්තියට පැමිණි විදුහල්පතිතුමා පැවසුවේ ය. එවිට අපට සිහියට නැගෙන්නේ,

(1) වැලිවිට සරණංකර හිමියන් ය (2) වැත්තෑවේ හිමියන් ය

(3) රේරුකානේ චන්ද්‍රවිමල හිමියන් ය (4) වාරියපොල සුමංගල හිමියන් ය

(18) මහසෑයට පමණක් දෙවැනි වන අසිරිමත් ගොඩනැගිල්ලකි. ලෝවාමහාපාය එය ඉදි කළ රජතුමා ලෙස සැලකෙන්නේ,

(1) එළාර රජු ය (2) නිශ්ශංකමල්ල රජු ය

(3) දුටුගැමුණු රජු ය (4) දෙවනපෑතිස් රජු ය

(19) දිය සිඳී ගිය පොකුණක සිට පසුතැවීමට පත්වන මහලු කොස්වාලිහිණියෙක් මෙන් පසුතැවීමට පත්වන ඇතැම් අය පිළිබඳ අපට අසන්නට ලැබේ. එවන් අවස්ථාවක සිහියට නැගෙන ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,

(1) අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං

(2) අසාරේ සාරමතිනෝ - සාරේ චා සාර දස්සිනෝ

(3) උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ

(4) දූරං ගමං ඒක චරං - අසරීරං ගුහාසයං

(20) බුදු දහමේ සඳහන් සිරිත් හෙවත් සමාදානයට අයත් වන්නේ,

(1) සතුන්ට කරුණාව දැක්වීම හා නොදුන් දේ ගැනීමෙන් වැළකීමය

(2) නොදුන් දේ ගැනීමෙන් වැළකීම හා සතුන් මැරීමෙන් වැළකීමය

(3) සතුන්ට කරුණාව දැක්වීම හා දුන්දේ පමණක් ගැනීම ය

(4) සතුන් මැරීමෙන් වැළකීම හා සතුන්ට කරුණාව දැක්වීමය

(21) කායික මෙන්ම මානසික සෞඛ්‍යයෙන් යහපත් පුද්ගලයෙකු බවට පත්වීම සමගියෙන් සාමකාමීව සුහදව සිටීම ද මනා සිහිනුවනින් කටයුතු කිරීම ආදිය කරන පුද්ගලයකු වන්නේ,

(1) මධ්‍යසාර භාවිතයෙන් වැළකීමෙනි (2) සොරකමින් වැළකීමෙනි

(3) සතුන් මැරීමෙන් වැළකීමෙනි (4) කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමෙනි

(22) සිල්වත් වීමෙන් මෙලොව දී ලැබෙන ආනිසංස ගණන වන්නේ,

(1) හතරකි (2) පහකි (3) හයකි (4) තිස් අටකි

(23) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන ආකාරයට භෝග විනාශයට හේතු වන කරුණු ගණන වන්නේ,

(1) හතරකි (2) පහකි (3) හයකි (4) දෙකකි

(24) ශික්ෂාකාමී බව, අල්පේච්ඡ බව, නිරහංකාර බව, ස්ථිර අධිෂ්ඨානය වැනි ආදර්ශ අපේ ජීවිතයට ළංකර ගත හැක්කේ,

(1) වැලිවිට සරණංකර හිමි චරිතයෙනි (2) අජාසත් රජුගේ චරිතයෙනි

(3) දුටුගැමුණු රජුගේ චරිතයෙනි (4) කාවන්තිස්ස රජුගේ චරිතයෙනි

(25) මහනුවර පැවැත් වූ දේවාල පෙරහැරට ශ්‍රී දන්ත ධාතූන් වහන්සේට උපහාර දැක්වීමේ මාළිගාවේ මහ පෙරහැර ද එක් කරන ලද්දේ කාගේ උපදෙස් අනුව ද?

(1) කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ (2) දුටුගැමුණු රජුගේ

(3) වැලිවිට සරණංකර හිමිගේ (4) වාරියපොල සුමංගල හිමිගේ

(26) අසීමිත ආශාවන්ගෙන් තොරවීම, බොහෝ වැඩකටයුතු වලින් තොරවීම, අතිමානයෙන් තොරව කටයුතු කිරීම ආදියට යොමු වන්නේ,

(1) තිලකුණු දන්නා තැනැත්තා ය (2) බුදුගුණ සිහි කරන තැනැත්තා ය

(3) සිල් රකින තැනැත්තා ය (4) වීර්යය වඩන තැනැත්තා ය

(27) නිසැකවම ලොව උපන් සත්වයා වයසට යාම, මියයාම ආදී දුක් පීඩාවන්ට ගොදුරු වන බව සිදුහත් කුමරා වටහා ගත්තේ,

(1) ආනාපානසති භාවනාව වැඩීමෙනි (2) සතර පෙර නිමිති දැකීමෙනි

(3) නිබ්බුත පද ඇසීමෙනි (4) මහාමායා දේවිය කලුරිය කළ බව සිහිවීමෙනි

(28) ''රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං'' යනුවෙන් සිදුහත් කුමරාගේ මුවින් පිටවූයේ කුමන අවස්ථාවක ද?

(1) රාහුල කුමරු දායාද ඉල්ලා පැමිණි අවස්ථාවේ

(2) රාහුල කුමරු දෙස බලා අභිනිෂ්ක්‍රමණයට සූදානම් වූ අවස්ථාවේ

(3) රාහුල කුමරු පැවිදි කරවීමට සූදානම් වූ අවස්ථාවේ

(4) යසෝදරා දේවියට පුතෙකු ලද බව පණිවිඩකරුවන් පැවසූ අවස්ථාවේ

(29) සිදුහත් බෝසතාණන් වහන්සේ අභිනිෂ්ක්‍රමණය කළේ,

(1) වෙසක් පෝයදා (2) පොසොන් පෝයදා (3) ඇසළ පෝයදා (4) දුරුතු පෝයදා

(30) භික්ෂු සමාජය ආරම්භ වූයේ ,

(1) පස්වග තවුසන් මහණ වීමෙනි (2) යසකුල පුත්‍රයා මහණ වීමෙනි

(3) යසකුල මිත්‍රයාගේ මිතුරන් පැවිදි වීමෙනි (4) භද්දවග්ගිය කුමාරවරු පැවිදි විමෙනි

(31) අකුසල් මුල් ලෙස හැඳින්වෙන්නේ,

(1) ලෝභ, ද්වේශ , මෝහ (2) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම

(3) අලෝභ , අද්වේශ, අමෝහ (4) ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය නමිනි

(32) තෙරුවන ගුණ දැන ඇති කර ගන්නා පැහැදීම හඳුන්වන්නේ ,

(1) ප්‍රඥාව නමිනි (2) ශ්‍රද්ධාව නමිනි (3) සිල්වත්වීම නමිනි (4) භක්තිමත්වීම නමිනි

(33) බුද්ධ රත්නයේ ගුණ සිහි කරන ඉතිපිසෝ ගාථාවට අනුව බුදු ගුණ ප්‍රමාණය,

(1) හයකි (2) හතකි (3) නවයකි (4) තුනකි

(34) බුදු රජාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ නිසාත්, සියලු කෙලෙසුන් දුරු කළ නිසාත්, සියලු පූජාවන් ලැබීමට සුදුසු නිසාත්,

(1) අරහං නම් වේ (2) සුගත නම් වේ

(3) ලෝකවිදූ නම් වේ (4) පුරිසදම්ම සාරථී නම් වේ

(35) බුදු රජාණන් වහන්සේ තම ගුරු තනතුරේ තබා ගත්තේ,

(1) ආනන්ද හිමියන් ය (2) මහා ප්‍රජාපති ගෝතමී තෙරණියයි

(3) අගසව් දෙනමය (4) ධර්ම රත්නය යි

(36) මහා සංඝරත්නය මනා වූ පිළිවෙත් පුරන බැවින් ,

(1) සුපටිපන්න නම් වේ (2) උජුපටිපන්න නම් වේ

(3) ආහුණෙය්‍ය නම් වේ (4) පාහුණෙය්‍ය නම් වේ

(37) සිත කිළිටි කරන කුසල් සිතිවිලිවලට බාධා කරන සිතිවිලි හඳුන්වන්නේ,

(1) අකුසල් නමිනි (2) නීවරණ නමිනි

(3) පව් සිතිවිලි නමිනි (4) විචිකිච්ඡා නමිනි

(38) වැලිවිට සරණංකර හිමි රචනා කළ ග්‍රන්ථයක් නොවන්නේ,

(1) මුණිගුණාලංකාරය (2) සතර බණවර සන්නස

(3) සාරාර්ථ සංග්‍රහය (4) නිකාය සංග්‍රහය

(39) ''සිතෙහි කයෙහි නිදිමත ගතිය, උදාසීනකම නිසා පාඩම් කළ දෙය මගේ මතකයට නොනැගේ''' යනුවෙන් මලින්ද පැවසුවේය. ඔහු තුළ ඇති නීවරණය වන්නේ,

(1) ථීනමිද්ධයයි (2) ව්‍යාපාදයයි (3) විචිකිච්ඡාවයි (4) කාමච්ඡන්දයයි

(40) බෝසතාණන් වහන්සේ කිං කුසල ගවේසීව සිටි සමයේ දී හමු වූ සප්ත සමාපත්ති ලාභියෙකු වූයේ,

(1) භග්ගව තවුසා (2) ආලාරකාලාම තවුසා

(3) උද්දකරාමපුත්ත තවුසා (4) කොණ්ඩඤ්ඤ තවුසා

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පළමු වාර පරීක්ෂණය - 2020

10 - ශ්‍රේණිය

බුද්ධ ධර්මය - II

නම/විභාග අංකය :- ....

පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතකට පිළිතුරු සපයන්න.
පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගත් අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

(1) (i) පංච විලෝකනවලින් දෙකක් නම් කරන්න.
(ii) සිදුහත් බෝසතාණන් වහන්සේට නිබ්බුත පද කීවේ කවුද?
(iii) පුද්ගල චරිත හයකි. ඉන් දෙකක් නම් කරන්න.
(iv) ශ්‍රද්ධාව යනු කුමක්ද?
(v) '' චිත්තං සමේතීති සමථෝ '' යන්නෙහි අදහස ලියන්න.
(vi) පංච නීවරණවලින් දෙකක් නම් කරන්න.
(vii) සීලයෙහි විරමණය හා සමාදානය යනු කුමක්දැයි ලියා දක්වන්න.
(viii) සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් භෝග විනශමුඛ වලින් දෙකක් නම් කරන්න.
(ix) ''මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය'' යන ප්‍රකාශය කළේ කවුද?
(x) යථාභූත ඤාණ දස්සනය යනු කුමක්ද? (ලකුණු 2×10=20)

(2) (i) සීලය යනු කුමක්ද? (ලකුණු 02)
(ii) සිල්වත්වීමෙන් ලැබෙන ආනිසංසවලින් තුනක් නම් කරන්න. (ලකුණු 03)
(iii) සිල්වත්ව කටයුතු කිරීමෙන් පුද්ගලයාට සිදුවන යහපත කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(3) (i) උට්ඨානවතෝ සතිමතෝ ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)
(ii) එහි තේරුම ලියන්න. (ලකුණු 03)
(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්ම පදය ඉවහල් කර ගත හැකි අයුරු විස්තර කරන්න.(ලකුණු 05)

(4) (i) බෝසතාණන් වහන්සේ අභියෝග ජයගත් අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ඉන් එක් අවස්ථාවක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)
(iii) ඔබ ජීවිතයේදී අභියෝග ජයගත් අවස්ථා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(5) (i) පංච අභිඥා අෂ්ට සමාපත්තිය ලබා ගැනීමට වැඩිය යුතු භාවනාව කුමක්ද? (ලකුණු 02)
(ii) භාවනා වැඩීම සඳහා යොදාගත හැකි ඉරියව්වලින් තුනක් නම් කරන්න. (ලකුණු 03)
(iii) සමථ භාවනාවෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(6) (i) බුද්ධානුස්සති භාවනාව හඳුන්වන වෙනත් නමක් ලියන්න. (ලකුණු 02)
(ii) සුගත බුදු ගුණය නම් කරන්න. (ලකුණු 03)
(iii) බුද්ධානුස්සති භාවනාවේ යෙදීමේ වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(7) පහත මාතෘකා වලින් දෙකකට කෙටි සටහන් ලියන්න.
(i) දුටුගැමුණු රජතුමා (ii) විපස්සනා භාවනාව
(iii) සඟ ගුණ (iv) ත්‍රිලක්ෂණය. (ලකුණු 5×2=10)

01 - 2	11 - 1	21 - 1	31 - 1
02 - 2	12 - 4	22 - 1	32 - 2
03 - 4	13 - 3	23 - 3	33 - 3
04 - 3	14 - 3	24 - 1	34 - 1
05 - 2	15 - 2	25 - 3	35 - 4
06 - 2	16 - 2	26 - 1	36 - 1
07 - 4	17 - 1	27 - 2	37 - 2
08 - 1	18 - 3	28 - 4	38 - 4
09 - 4	19 - 1	29 - 3	39 - 1
10 - 2	20 - 3	30 - 1	40 - 2

(ලකුණු 1x 40 = 40)

11 කොටස

(1) (i) කාලය, දීපය, දේශය, කුලය, මව

(ii) කිසාගෝතමී

(iii) රාග චරිත, ද්වේශ චරිත, මෝහ චරිත, පද්ධා චරිත, බුද්ධි චරිත, විතර්ක චරිත

(iv) තෙරුවන් ගුණ දැන ඇති කර ගන්නා පැහැදීම ශ්‍රද්ධාවයි.

(v) සිත සන්සුන් කර ගන්නේ සමථයයි.

(vi) කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා

(vii) විරමණය යනු වැරදි වලින් වැළකීමය. සමාදානය යනු කළ යුතු යහපත් දේ කිරීමයි.

(viii) මද්‍යසාර ගැනීම, නුසුදුසු වේලාවන්හි මංමාවත්වල සැරිසැරීම, නැටුම් ගැයුම් වැයුම්වල ලොල්වීම, සුදුවෙහි යෙදීම, පව්ටු මිතුර ඇසුර, අලසකම

(ix) දුටුගැමුණු රජතුමා

(x) සාමාන්‍ය සම්මුති නුවණ ඉක්මවා ඇත්ත ඇති සැටියෙන් දැකීම (ලකුණු 2 x 10 = 20)

(2) (i) කය වචනය සංවර කර ගැනීම (ලකුණු 02)

(ii) ⋆ මහත්වූ භෝග සම්පත්තියක් අත්පත් කර ගැනීම

⋆ කීර්තිය පැතිරීම

⋆ ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකිවීම

⋆ සිහිමුලා නොවී කලුරිය කිරීම

⋆ මරණින් මතු සුගතියෙහි උපත ලැබීම (ලකුණු 03)

(iii) ඉහත ආනිසංස ඇතුළුව විස්තර ඇති කරුණු සලකා බලා සුදුසු පරිදි ලකුණු දෙන්න. (ලකුණු 05)

(3) (i) උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ

සඤ්ඤතස්සච ධම්ම ජීවිනෝ - අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති (ලකුණු 02)

(ii) උත්සාහවන්ත වූ මනා සිහිය ඇති නිවැරදි දෙය පරීක්ෂාකාරීව කරන හික්මීමෙන් යුත් දැහැමිව ජීවත්වන තැනැත්තාගේ යසස වැඩෙන්නේය. (ලකුණු 03)

(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර වන අයුරු පැහැදිලි වන අයුරු දක්වා තිබිය යුතුය. ධම්මපද ගාථා තුනක්වත් ඇසුරින් ලියා ඇති පිළිතුරකට සුදුසු පරිදි ලකුණු දෙන්න. (ලකුණු 05)

(4) (i) ⋆ උපත සිදුවී සත් දිනකින් මව කළුරිය කිරීම

⋆ විවාහ ජීවිතයට සුදුසු කුමරියක තෝරා ගැනීමේදී ඥාතින් ඉදිරියේ ශිල්ප දැක්වීමට සිදුවීම

⋆ පස්කම් සැප අත්හැර පැවිදිවීමට සිදුවීම

⋆ යසෝදරා දේවිය හා රාහුල කුමරු හැරදා පැවිදිවීමට සිදුවීම ......ආදී අවස්ථාවලින් දෙකක් (ලකුණු 02)

(ii) ඉහත විස්තර කර ඇති අවස්ථාවලින් එකක් විස්තර කර තිබිය යුතුය. (ලකුණු 03)

(iii) සුදුසු පරිදි ලියා ඇති පිළිතුරකට ලකුණු පිරිනමන්න. (ලකුණු 05)

(5) (i) සමථ භාවනාව (ලකුණු 02)

(ii) හිටගෙන ,හිඳගෙන, සක්මන් කරමින් ,සයනය (මින් තුනක්) (ලකුණු 03)

(iii) ලෝභ, ද්වේශ, මෝහ ආදී කෙලෙස් සිතුවිලි පාලනය වීම, ධාරණ ශක්තිය වැඩිවීම, පොතපත පාඩම් කිරීමේදී වෙනදාට වඩා පහසුවක් දැනීම, අසහනය නැතිවී ප්‍රසන්න පෙනුමක් ඇතිවීම, කායික රෝග පීඩා අඩුවී නිරෝගී වීම, සිත එකඟ කර ගත හැකිවීම .....ආදී කරුණු ඇතුළත් වන පරිදි ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න. (ලකුණු 05)

(6) (i) බුදුගුණ භාවනාව (ලකුණු 02)

(ii) බුදු රජාණන් වහන්සේ ආර්ය මාර්ගයේ ගමන් කළ නිසාත් සුන්දරවූ නිර්වාණයට සැපත් වූ නිසාත් යහපත් වචන ඇති නිසාත් සුගත නම් වේ. (ලකුණු 03)

(iii) බුදුන් වහන්සේ කෙරෙහි ගෞරවය වැඩිවීම, අකුසල් සිතුවිලි සිතෙන් ඉවත්වීම, ධාරණ ශක්තිය වැඩිවීම, සිතෙහි තෘප්තිමත් බව ඇතිවීම ආදී කරුණු ඇසුරු කරමින් ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න.(ලකුණු 05)

(7) (i) දුටුගැමුණු රජතුමා

කාවන්තිස්ස රජු හා විහාරමහා දේවියගේ වැඩිමහල් පුත්‍රයාය. ගැමුණු කුමරු කුඩා කල සිට මහා සංඝරත්නය ඇසුරේ හැදී වැඩුනහ.

'' මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසිකලෙකත් රජ සැප පිණිස නොවන්නේය'' යන අභීත සටන් පාඨය අනුව කටයුතු කර රට ජාතිය ආගම බේරා ගැනීමට කටයුතු කළේය. අනුරාධපුර'විජිතපුර' නම් ස්ථානයේ එළාර රජු සමග මුහුණට මුහුණලා සටන් කොට එළාර රජු පැරදවීය. සටනේ දී මියගිය එළාර රජු රාජ්‍ය ගෞරව සහිතව ආදාහනය කර සෑයක් ද තනවා එතැනින් යන විට නිශ්ශබ්දතාවය දැක්විය යුතු ලෙස ජනතාව දැනුවත් කළේය. මෙතුමාගේ ප්‍රධානතම මෙහෙවර රුවන්වැලිසෑය ඉදිකිරීමය. මිරිසවැටියද එතුමා කරවීය. මහසෑයට පමණක් දෙවැනි වූ ලෝවාමහාපාය ද ඉදි කරවීය. රජතුමා ධර්ම ශ්‍රවණයට ඉමහත් කැමැත්තක් දැක්වූ බැවින් හැම ගමකම භික්ෂූන් වහන්සේ නමක් ලවා ධර්ම දේශනා කරවීය. එතුමාගේ රජ කාලය තුළ සුවිසි වසරක් වෙසක් උත්සව පවත්වා ඇත. ආරෝග්‍ය ශාලා පිහිටුවා ගිලන් සේවයක් ද ආරම්භ කළේය. තමා විසින් කරන ලද හොඳ වැඩ පිං පොතක ලියා තැබුවේය.

(ii) විපස්සනා භාවනාව

විපස්සනා හෙවත් විදර්ශනා යනුවෙන් දැක්වෙන්නේ යථාර්ථය මනා නුවණින් විශේෂයෙන් දැකීමය. එනම් ඇත්ත ඇති සැටියෙන් දැකීමයි.

'' විසේසේන පස්සතීති විපස්සනා '' විශේෂ වශයෙන් බලයි, දකියි යන අර්ථයෙන් ද විපස්සනා යයි කියනු ලැබේ. විකෘතියකින් විපරීතයකින් තොරව ප්‍රකෘතිය ප්‍රකෘතියයක් ලෙසම දැන දැන පසක් කරන එකී විදසුන් නුවණ ලැබීමට උපකාරී වන්නේ විපස්සනා භාවනාවයි. විපස්සනා භාවනාව ප්‍රඥා භාවනාව නමින්ද තිලක්ෂණ භාවනාව නමින් ද හැඳින්වේ. විපස්සනා භාවනාව වඩන තැනැත්තා අටලෝ දහමින් කම්පා නොවේ. චාම් අල්පේච්ඡ ජීවිතයක් ගත කරයි. අසීමිත ආශාවන්ගෙන් තොරවේ. ලද පමණින් සතුටුවේ. පහසුවෙන් පෝෂණය කළ හැකි වෙයි. අතිමානයෙන් තොරවේ. නිවන් සැප ලබා ගැනීමට ද මෙම භාවනාව උපකාරීවේ.

(සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න)

(iii) සඟ ගුණ

සඟ ගුණ දැක්වෙන්නේ සුපටිපන්නෝ...... ආදී ගාථාවෙනි. එහි ඇති සඟ ගුණ නවයකි. සුපටිපන්නෝ, උජුපටිපන්නෝ, ඤායපටිපන්නෝ, සාමීචිපටිපන්නෝ, ආහුණෙයියෝ, පාහුණෙයියෝ, දක්ඛිණෙයියෝ, අංජලිකරණෙයියෝ ,අනුත්තරෝ, පුඤ්ඤක්ඛෙත්තං, ලෝකස්ස යනු එම සඟ ගුණයන්ය.

(iv) ත්‍රිලක්ෂණය

ත්‍රිලක්ෂණය යනු අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනුය, **අනිත්‍ය** යනු වෙනස් වන සුළු බවයි. කැඩෙන බිඳෙන බවයි, මොහොතින් මොහොත වෙනස් වන බවයි. අපගේ ජීවිතයද මව්කුස පිළිසිඳ ගත් දින සිට මොහොතින් මොහොතක් පාසා වෙනස් වන්නා සේම ලොව ඇති සියලුම ජීවී අජීවී සියල්ල මොහොතක් මොහොතක් පාසා වෙනස් වේ. පංචස්කන්ධය ද වෙනස් වන බව දැක්වීමට රූපය පෙණ පිඩකට, වේදනාව දිය බුබුලකට, සඤ්ඤාව මිරිඟුවකට, සංස්කාර කෙසෙල් කඳකට, විඤ්ඤාණය මායාවකට උපමා කර ඇත.

දුක්ඛ යනු ලොව සියල්ලම වෙනස්වීම්වලට භාජනය වන බැවින් දුකට පත්වේ. බුදුන් වහන්සේ මංගල ධර්ම දේශනයේදි ඉපදීම, ලෙඩවීම, මහලුවීම...... ආදිය දුක බව දේශනා කළහ.

අනාත්ම යනු නිත්‍ය වූ ස්ථිර වූ නොවෙනස්ව පවතින ආත්මයක් නැත යන්න යි.

(ලකුණු 5 x 2 = 10)